වලිකාමම් දකුණ ප්‍රාදේශීය සභාව
යාපනය දිස්ත්‍රික්කය
----------------------

1 මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
--------------------------------

2016 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 22 දිනද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 24 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, 2016 වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 ජූලි 17 දින සභාවේ ලේකම්ට වෙත යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
-------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට වලිකාමම් දකුණ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
----------------------------------------

1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති
-------------------------

සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අනුගමනය කළ ගිණුම්කරණ ප්‍රතිපත්ති සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව්කර නොතිබුණි.

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු
---------------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට 2015 වර්ෂය අවසානය දක්වා ගෙවිය යුතුව තිබුණු රු. 4,768,150 ක් ගිණුම්වල පෙන්වා නොතිබුණි.

(ආ) පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට 2016 වසරට අදාලව ගෙවිය යුතු රු. 340,446 ක් ආදායම් හා වියදම් ගිණුමට ගෙන නොතිබුණි.

(ඇ) සභාවට අයත් නොවන රු. 3,242,600 ක් වටිනා ඉඩම් ස්ථාවර වත්කම්වලට ඇතුලත් කර තිබීමෙන් ස්ථාවර වත්කම්වල අගය වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) ප්‍රාදේශීය සභාවට පරිත්‍යාග වශයෙන් ලැබී තිබූ මොටර් වාහන 07 ක වටිනාකම් ගිණුම්වලට ගෙනවිත් නොතිබූ හෙයින් මෝටර් වාහනවල වටිනාකම් අඩුවෙන් දක්වා තිබුණි.

1.3.3 ලේඛන හා පොත්පත් නොපැවැත්වීම
------------------------------------------------

සභාව විසින් හානි හා පාඩු ලේඛනය,මිණුම් ලේඛනය,ඉඩම් විකුණුම් බදු ලේඛනය යනාදී ලේඛන පවත්වා නොතිබුණි.

1.3.4 විගණන සඳහා සාක්ෂි නොවීම
---------------------------------

සනාථ කරන ලද ප්‍රතිලාභින්ගේ ලැයිස්තු ඉදිරිපත් නොකිරීම නිසා රු. 32,580 ක් වටිනා ගනුදෙනු 03 ක් විගණනයේදී සත්‍යෝක්ෂණය කිරීමට නොහැකි විය.

1.3.5 නීති, රීති, රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත දැක්වෙන අනුකූල නොවූ අවස්ථා නිරීක්ෂණය විය.

| නීති, රීති සහ රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| 1990 ඔක්තෝබර් 10 වන දිනැති අංක 41/90 දරණ රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු අමාත්‍යංශයේ චක්‍රලේඛය | සභාව සතු වාහන 36 ක ඉන්ධන දහනය පරීක්ෂාව සිදුකර නොතිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵලය

සමාලෝචිත වර්ෂයේ සභාවේ ක්‍රියාකාරකම්වල ප්‍රතිඵලය පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම රු. 88,725,538 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ වියදම් ඉක්මවූ ආදායම රු. 104,360,089 ක් විය. මේ අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 15,634,551 කින් පහත වැටීමක් පෙන්නුම් කෙරිණි.

2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ සභාවේ මූල්‍ය ප්‍රතිඵලය ශුද්ධ අතිරික්තය රු. 2,545,325 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ශුද්ධ අතිරික්තය රු. 12,522,543 ක් විය. මෙය සමාලෝචිත වර්ෂයේ අවසාන මූල්‍ය ප්‍රතිඵලය රු. 9,977,218 කින් පහත වැටීමක් පෙන්නුම් කෙරිණ.

2.3 කාරක ප්‍රාග්ධන කළමනාකරණය

ඉදිරිපත්කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සභාවේ සමාලෝචිත වර්ෂයේ කාරක ප්‍රාග්ධනය රු. 218,452,637 ක් වී තිබූ අතර එයට අනුකූලව ඉකුත් වර්ෂයේ කාරක ප්‍රාග්ධනය රු. 188,413,764 ක් වී තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ කාරක ප්‍රාග්ධනයේ රු. 30,038,873 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණි.

2.4 ආදායම් පරිපාලනය

2.4.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

ලේකම් විසින් ඉදිරිපත් කර තිබූ පරිදි සමාලෝචිත වර්ෂය සඳහා ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | 2016<br>-------<br>ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 |
| වරිපනම් හා බදු | 2,887 | 1,791 | 5,902 |
| බදු කුලී | 36,522 | 34,294 | 2,258 |
| බලපත්‍ර ගාස්තු | 12,310 | 20,001 | - |
| වෙනත් ආදායම් | 90,179 | 101,762 | 115,716 |
| එකතුව | 141,898 | 157,848 | 123,876 |

2.4.2 වරිපනම්

වරිපනම් බදු රු. 5,901,887 ක් මෙතෙක් අයකර ගෙන නොතිබුණි.

2.4.3 බදු සහ කුලි

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2012 වර්ෂයේ සිට අයවිය යුතු බදු මුදල රු. 2,120,526 ක් මෙතෙක් අයකර ගෙන නොතිබුණි.

(ආ) කඩ කාමර 02 ක කඩකුලි රු. 103,445 ක් මෙතෙක් අයකර ගෙන නොතිබුණි.

2.4.4 බලපත්‍ර ගාස්තු

සන්නිවේදන කුළුනු 09 කින් බදු අයකර නොතිබුණි.

2.4.5 මුද්දර ගාස්තු

මුද්දර ගාස්තු රු. 107,204,178 ක් මෙතෙක් අයකර නොතිබුණි.

3 මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සභාවේ අනුමත සේවක සංඛ්‍යාව 124 ක් වුවද තත්‍ය සේවක සංඛ්‍යාව 115 කි. ඒ අනුව නිලධාරින් 12 ක ඌනතාවයක් සහ සේවකයන් 03 අතිරික්තයක්ද තිබුණි.

(ආ) මාර්ග දෙපස සිටුවා තිබූ ගස් නඩත්තු කිරීම සඳහා ලැබී තිබූ රු. 927,781 ක මුදල අදාල කාර්යය සඳහා යොදවා නොතිබුණි.

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

රු. 932,230 ක් වටිනා ප්‍රාග්ධන වැඩ 03 ක් සභාව විසින් මෙතෙක් ඉටුකර නොතිබුණි.

3.3 ප්‍රමාදවූ ව්‍යාපෘති

--------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ක්‍රීඩා පිටිය වටා මීටර් 407 ක් දිගට තාප්පය ඉදිකිරීම සඳහා රු. 3,254,000 ක මුදලක් වෙන්කර තිබුණද, මෙතෙක් එම කර්මාන්තය ඉටුකර නොතිබුණි.

(ආ) සුසාන භූමි ආදාහනාගාරය ඉදිකිරීම සඳහා රු. 532,230 ක් වූ ගිවිසුම අත්සන් කර තිබුණද, එම කර්මාන්තය ප්‍රාදේශීය සභාව විසින් ක්‍රියාත්මක කර නොතිබූ බව නිරීක්ෂණය විය.

4 ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

---------------------------------------

අයවැය පාලනය

-----------------

වියදම් ව්‍යුහය

---------------

අයවැයගත වියදම් සහ තත්‍ය වියදම් අතර රු. 3 සිට රු. 14,663,530 දක්වා වියදම් විචලනයක් විගණනයේදී නිරීක්ෂණය විය.